# An Inquiry into Western Psychological Attitudes to Child and Child Mental Development

ළමයා හා ළමා මානසික සංවර්ධනය පිළිබඳ බටහිර මනෝවිද්‍යාත්මක ආකල්ප විමසුම

Karapikkada Sobitha

කරපික්කඩ සෝභිත හිමි

## ළමයා පිළිබඳ අර්ථ නිරූපණ

### එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය

ළමයින් කෙරෙහි විශේෂ රැකවරණය සහ සැලකිල්ලක් දැක්වීමේ අවශ්‍යතාව 1924 දී ළමා අයිතිවාසිකම් පිළිබඳ ජිනීවා ප්‍රකාශනයෙන් ද, 1959 දී එක්සත් ජාතීන් විසින් සම්මත කරගන්නා ලද ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයෙහි ද සඳහන් වේ. එමෙන් ම මිනිස් අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙන් ද, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 23 හා 24 වන වගන්ති වලින් ද, ආර්ථික සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ දහවැනි ව්‍යවස්ථාවෙන් ද, ළමා සුභසිද්ධියට සම්බන්ධ විශේෂිත නියෝජිත ආයතනවල හා ජාත්‍යන්තර සංවිධානවල ව්‍යවස්ථාවලින් ද ළමයින් පිළිබඳ දැක් වූ අවධානය සැළකිල්ලට ගනිමින් ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය 1989 නොවැම්බර් මස 20 වැනි දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් අනුමත කොට සම්මත කරගන්නා ලදි.

මෙය සියලුම ළමයින් හට ඇති අයිතිවාසිකම් පිළිබඳ සඳහන්ව ඇති ලියවිල්ල ලෙස සළකනු ලබයි. ශ්‍රී ලංකාව ද ඇතුලු ව ලොව සෑම රටක් ම පාහේ මෙය පිළිගෙන ඇති අතර, ළමයින් හට සැළකීමේ දී මෙම ලියවිල්ල පාදක කරගත යුතු බව එහි සඳහන් වේ.

එක්සත් ජාතීන්ගේ ළමා අයිතීන් පිළිබඳ ප්‍රඥප්තියට අනුව අවුරුදු දහඅට 18 අඩු සෑම කෙනෙකු ම ළමයෙකු ලෙස සළකනු ලබයි. ඔවුන් හට මෙම ප්‍රඥප්තියේ සඳහන් සියලු ම අයිතිවාසිකම් හිමි වේ.[1]

### නීතිය අනුව ළමයා යනු කවරෙක් ද ?

ජාත්‍යන්තරව මෙන් ම දේශියව ද සාමාන්‍ය පිළිගැනීම වයස අවුරුදු 18 අඩු අය ළමයින් බව වුවත්, අප රටේ ළමයින්ට බලපාන විවිධ නීති තුළ ළමයා යන්න විවිධාකාරයෙන් අර්ථ දක්වා ඇත.

දණ්ඩනීති සංග්‍රහයේ (1995/22 දරණ සංශෝධනයේ) වයස අවුරුදු 18 ට අඩු අයෙකු ළමයෙකු බව දක්වා ඇත.

ළමයින් හා යෞවනයින් පිළිබඳ ආඥා පනතේ ද, දරුවන් දරුකමට හදාගැනීමට හෙවත් කුල වැදීමේ ආඥා පනතේ ද, කාන්තාවන් හා ළමයින් සේවයේ යෙදවීමේ පනතේ ද වයස අවුරුදු 14 ට අඩු අය ළමයින් බව සඳහන් වේ.

---

1 අබේපාල, රෝලන්ඩ්, මුල් ළමාවිය සංවර්ධනය හා අධ්‍යාපනය, 2017, සාර ප්‍රකාශන, කොට්ටාව, පිටුව 41.

අනත්දරු ආඥා පනත, සිවිල් නඩු විධාන සංග්‍රහයට අනුව වයස අවුරුදු 18 අඩු අයෙකු ළමයෙකු බව දක්වා ඇත.

සාප්පු හා කාර්යාල සේවකයින් සම්බන්ධ ආඥා පනතට අනුව වයස අවුරුදු 14 ට අඩු අය සේවයේ යෙදවිය නොහැක. ඒ අනුව වයස අවුරුදු 14 ට අඩු අය ළමයින් සේ සැළකේ.

නඩත්තු පනතට අනුව වයස අවුරුදු 25 ට අඩු අයෙකු ළමයෙකු ලෙස පෙන්වා දී ඇත.[2]

**ශබ්ද කෝෂ විශ්ව කෝෂ අර්ථ නිරූපණ**

මලලසේකර ඉංග්‍රීසි සිංහල ශබ්ද කෝෂයට අනුව වැඩිවිය නොපැමිණි දරුවා, නූපන් හෝ අලුත උපන් දරුවා, පුතා හෝ දුව (වයස නොසළකා) යනු The Child හෙවත් ළමයා වේ.

රීස් ඩේවිඩ්ස් සහ විලියම් ස්ටෙඩ් ගේ පාලි - ඉංග්‍රීසි ශබ්ද කෝෂයට අනුව "බාලක" යනුවෙන් ළමයා හඳුන්වා ඇත.

**ළමා සංවර්ධනය පිළිබඳ මනෝවිද්‍යාත්මක ආකල්පය.**

ළමා සංවර්ධනය පිළිබඳ මනෝවිද්‍යාත්මක, ජීව විද්‍යාත්මක මෙන් ම වෙනත් විවිධ පැතිකඩ ඔස්සේ බොහෝ අර්ථ කථනයන් දැකගත හැක. ඒ අතර WIKIPEDIA විශ්ව කෝෂය තුළ "ළමා සංවර්ධනය" යන්න අර්ථ දක්වන්නේ "ළමා සංවර්ධනය යනු පිළිසිඳ ගැනීමේ සිට නව යොවුන් විය දක්වා කාලය තුළ ජීව විද්‍යාත්මකව හා මනෝ විද්‍යාත්මකව සිදුවන ක්‍රමානුකූල සංවර්ධනය ක්‍රියාවලිය" යනුවෙනි.

එසේම "ළමා සංවර්ධනය මිනිසාගේ උපත සහ නව යෞවනය අතර කාලය තුළ සිදුවන ජීව විද්‍යාත්මක වෙනස්වීම් වලට සාපේක්ෂව පුද්ගලයා යැපීමේ තත්ත්වයේ සිට ස්වාධීනත්වයට ළඟාවීම හා සම්බන්ධ වේ" යනු ළමා සංවර්ධනය සම්බන්ධ වූ තවත් ප්‍රකට නිර්වචනයකි[3]

පිළිසිඳ ගැනීමේ සිට මරණය දක්වා එනම් පුද්ගලයෙකුගේ ජීවිතයේ ආරම්භයේ සිට අවසානය දක්වා ඔහු ඇය තුළ සිදුවන අනුක්‍රමික වෙනස්වීම් මාලාව මානව සංවර්ධනය ලෙස සැළකේ. ඒ අනුව ළමා සංවර්ධනය යන ක්ෂේත්‍රයට අයත් වන්නේ දරුවෙකු පිළිසිඳ ගැනීමේ සිට නව යොවුන් විය දක්වා පුද්ගලයෙකුගේ සංවර්ධන ක්‍රියාදාමයයි. එනම් ඔහු හෝ ඇය තුළ සිදුවන අනුක්‍රමික වෙනස්වීම් මාලාව බව මහාචාර්ය විතානපතිරණ මහත්මිය පෙන්වා දෙයි. එය මූලික වශයෙන් කායික වශයෙන් ද මානසික වශයෙන් ද සිදු වේ.

---

[2] ළමුන්ට නීතිය අත්පත්‍රිකාව, ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව, කොළඹ, 2002.

[3] www.selfgrocth.com/articles/definition/child development.html

**ළමා කායික වර්ධනය**

ළමාවියෙහි කායික හෙවත් ශාරීරික සංවර්ධනය පිළිබඳ අවස්ථා දෙකක් යටතේ ජීව විද්‍යාව හා මනෝ විද්‍යාව ක්ෂේත්‍රයන් තුළ සාකච්ඡා වේ.

01. පූර්ව ප්‍රසව අවධිය

02. උපතේ සිට ළමාවියේ සංවර්ධනය

**පූර්ව ප්‍රසව අවධිය**

දරුවෙකු පිළිසිඳ ගත අවස්ථාවේ සිට එම දරුවා බිහිකරන අවස්ථාව දක්වා මව ගත කරන අවධිය " පූර්ව ප්‍රසව අවධිය" ලෙස සැළකේ. ජීවියෙකුගේ ආරම්භය සිදුවන්නේ පිරිමි ජන්මානුවක් හෙවත් ශුක්‍රාණුවක් ගැහැණු ජන්මානුවක් හෙවත් ඩිම්බයක් සමග සංසේචනය වීමෙන් සිදුවන පිළිසිඳ ගැනීමක් සමඟ ය. මවගේ කුස තුළ ජීවියාගේ වැඩීම අවධි 03 කින් යුක්ත වේ.

01. **බීජ අවධිය** - (දින 10-14)

02. **කලල අවධිය** - (දින 14-56)

03. **භ්‍රෑණ අවධිය** - (දින 57 සිට උපත දක්වා)[4]

**බීජ අවධිය**

බීජ අවධිය ලෙස සැළකෙන්නේ මුල් දින 10-14 කාලයයි. ඩිම්බය සංසේචනය වී මුල් පැය 24 ත් 30 ත් අතර කාළය තුළ යුක්තාණුව ද්විත්ව වේ. එතැන් සිට වේගයෙන් සෛල බෙදීමකට පාත්‍ර වේ. යුක්තාණුව සෑදී දින 03ක් වන විට එම සෛලයෙන් සෛල 32 ක් ගොඩනැගී ඇත. මෙසේ සෛලවලට බෙදීමෙන් ඩිම්බය සංසේචනය වූ පැලෝපීය නාලය දිගේ ගර්භාෂය කරා ගමන් කරයි. මේ ගමනට දින 04 ක් පමණ ගත වේ. ගර්භාෂයට ළගාවන මෙම යුක්තාණුව ජල්ලි වැනි ස්වභාවයකින් යුක්ත වන අතර එය බ්ලාස්ටියුල අවස්ථාව ලෙස හැඳින්වේ. මෙය ගර්භාෂය තුළ දින 2-3 ක් පාවෙමින් පවතී. මෙම කාලය තුළ දී එම බ්ලාස්ටියුලාවේ ඇති සෛල බෙදීම අරභයි. මෙම සෛල වෙන් වෙන් ව කාණ්ඩ සාදයි. සිරුරේ විවිධ කොටස් සකස් කරයි. මේ සෛල 150 ක් පමණ වර්ධනය වූ විට එය ගර්භාෂ බිත්තියේ ඇලෙයි. ඉන් පසු ශරීරයට අවශ්‍ය ඉන්ද්‍රිය පද්ධතිය මේ සෛල බාහිර හා අභ්‍යන්තර පටක වර්ධනය කරයි. අභ්‍යන්තර සෛල පටක එක්වී කලල බීජය වර්ධනය කරන අතර බාහිර පටකය එම ජීවී කලලය ගර්භාෂය තුළ දී ආරක්ෂා කිරීමට උපකාරී වන වැදෑමහ සහ පෙකනිවැල නිසි පරිදි වර්ධනය කරයි.[5]

---

[4] අබේපාල, රෝලන්ඩ්, මුල් ළමාවිය සංවර්ධනය හා අධ්‍යාපනය, සාර ප්‍රකාශන, 2007, 85 පිටුව.

[5] එම. 86 පිටුව.

**කලල අවධිය**

කලල අවධිය ආරම්භ වන්නේ බ්ලාස්ටියුලාව ගර්භාෂ බිත්තියේ ඇලීමත්, සම්බන්ධ වීමත් සමඟය. බ්ලාස්ටියුලාවේ වර්ධනය වූ සෛලවල අභ්‍යන්තර සෛල පටක කොටස මඟින් කලල වර්ධනය වී ඇත. සති 06 ක් පමණ වන විට තමා වෙත අන්තර්ගත සෛල පටකවලින් නැවත ප්‍රස්ථර තුනක් ගොඩනගා ගනී. බහිෂ්චර්මය හෙවත් පිටතින් ඇති සෛල පටකය සංවේදන ඉන්ද්‍රිය හා ස්නායු පද්දතිය මෙලෙස ගොඩනැගේ. මධ්‍ය චර්මය, අභ්‍යන්තර චර්මය, මාංශ පේශී, ඇට සැකිල්ල, රුධිරය සහ පහ කිරීමේ ඉන්ද්‍රියන් ද ආහාර ජීර්ණ පද්ධතිය, පෙනහලු සහ තෛරොයිඩ් ග්‍රන්ථීන් ද වර්ධනය කරයි. ගර්භාෂය සමඟ කලලය සම්බන්ධ වනුයේ යුක්තානුව මඟින් වර්ධනය කරනු ලැබූ වැදෑමහ ලෙකනිවැල සහ කලලවාරික කෝෂය මඟිනි. මෙම වැදෑමහ පෙකනිවැල සහ කලලවාරික කෝෂය මඟින් ළමයාට අවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ වන අම්ලකර සීනි පිෂ්ඨය, ජලය, ලවණ වර්ග, ප්‍රෝටීන් ආදිය සහ රෝග වළක්වන ද්‍රව්‍යයන් මවගෙන් උරා දෙයි. සිරුරට හානි කරන වෛරස් සහ විෂබීජ මෙම සියුම් පටක මඟින් ඇති කරයි.

මෙසේ ප්‍රධාන ඉන්ද්‍රියයන් බොහොමයක්ම කලල අවධියේ වැඩෙන නිසා ඊට බාධා විය හැකි තද ගැස්සීම්, කම්පනය, අහිතකර චිත්තවේග, මන්දපෝෂණය හා වෙනත් අහිතකර බාහිර බලපෑම් මේ අවධියේ දී වළක්වා ගත යුතුය. ගබ්සා වීමේ වැඩි ප්‍රවණතාවක් ඇති අවධිය මෙයයි. කලලයට ඉතා අහිතකර තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවුවහොත් ස්වයං සිද්ධ ගබ්සා සිදුවිය හැක. උපතින්ම ගෙන එනු ලබන ශාරීරික දුර්වලතා හා විකෘති ලක්ෂණ රැසක් ම ඇරඹෙන්නේ මේ අවධියේ ය. පැලුණු තොල්, උස් වූ තළල් ද, අත පා නිසි පරිදි නොවැඩීම, බිහිරි බව, අන්ධ බව යන රෝගයන් ද වැඩිපුර සෑදෙන්නේ මෙම කලල අවධියේ ය.[6]

**භ්‍රෑණ අවධිය**

භ්‍රෑණ අවධියට දරුවෙකු පිවිසෙන්නේ පිළිසිඳ ගැනීමෙන් සති 08 කට පසුව බව කියවේ. කලල අවධියේ ජීවියෙකුගේ ක්‍රියාකාරීත්වයට උපකාරී වන සියලු ඉන්ද්‍රියයන් ද, මූලික ස්නායු ද, මාංශ පේශීවල වර්ධන ද ආරම්භ වී ඇත. ඉතිරි හත් මාසය තුළ එනම් භ්‍රෑණ අවධියේ දී මෙම මූලික පදනම පිරිපහදු වීමත් සිදු වේ. කලල අවධිය සති 06 ක් වුව ද භ්‍රෑණ අවධිය සති 28 ක් වේ. භ්‍රෑණ අවධිය මුලින් සැකසී ඇති පදනම වඩාත් ශක්තිමත් කිරීම, නිසි පරිදි නිමවාලීම සිදු වේ.

ස්නායු පද්දතිය සහ මොළයේ ප්‍රධාන අංග කිහිපයක් ම වර්ධනය වනුයේ භ්‍රෑණ අවධියේ අවසාන කොටස තුළ දී ය. එසේම මෙම අංග වර්ධනයවීම උපතින් පසු මුල් මාස 06 තුළ දී සිදු වේ. ජීවියා මෙලොව බිහිවීමෙන් පසු ස්වාභාවිකව කටයුතු කිරීමට අවශ්‍ය සෑම අංශයක ම වර්ධනයත් භ්‍රෑණ අවධියේ දී සිදු වේ.[7]

---

[6] එම. 88 පිටුව.

[7] එම.

**උපතේ සිට ළමාවියේ සංවර්ධනය**

උපතේ සිට ළමාවියේ සංවර්ධනය පිළිබඳ විග්‍රහ කරන බොහෝ මනෝවිද්‍යාඥයන් එහිලා විවිධ අවධි වර්ගීකරණය කර ඇත. ඒ සියල්ල සම්පිණ්ඩනය කොට වඩාත් පුළුල් ලෙස සකස් කරන ලද වර්ගීකරණයක් මනෝවිද්‍යාව තුළ ඉදිරිපත් කොට ඇත. මේ තුළ ද වර්ධන අවධි පිළිබඳ බොහෝ මනෝවිද්‍යාඥයන් එකඟතාවක් පල කළ ද බෙදෙන වයස් සීමාවන් හා අනුඅවධි පිළිබඳ ඔවුන්ගේ එකඟතාවක් දක්නට නොමැති බව පෙනේ.

**01. නවජ දරුවා**

උපතේ සිට පළමු මාසය බොහෝ දුරට මවුකුසේ සිටිය දී පැවැති චර්යා ප්‍රදර්ශනය කරයි. කාලය දින 30 යි.

**02. බිළිඳු අවධිය**

මාස 01 සිට අවුරුදු 02 දක්වා කාලය.

**03. පෙර ළමා විය**

අවුරුදු 02 සිට අවුරුදු 05 දක්වා කාලය. (අවුරුදු 03යි.)

**04. ළමා විය**

අවුරුදු 05 සිට අවුරුදු 10 දක්වා කාලය. (අවුරුදු 05 යි)

**05. නව යොවුන් විය**

අවුරුදු 11 සිට අවුරුදු 18 දක්වා කාලය. (අවුරුදු 06 යි)[8]

**ළමා සංවර්ධනය හා බැඳි අනෙකුත් ක්ෂේත්‍ර**

**ළමා චිත්තවේග සංවර්ධනය**

ළමා මානසික සංවර්ධනයේ දී අවධානය යොමු කළ යුතු තවත් ක්ෂේත්‍රයක් වනුයේ ළමා චිත්තවේග කළමනාකරණයයි. චිත්තවේග යනු සිතේ ඇතිවන්නා වූ ආවේගයෝ ය. සිතේ ඇතිවන ක්‍රෝධය, භය, ප්‍රීතිය, ශෝකය වැනි ආවේගික හැඟීම් චිත්තවේග ලෙස සළකනු ලබයි. ගේට්ස් නම් මනෝවිද්‍යාඥයාට අනුව චිත්තවේග යනු පුද්ගලයා කැළඹීමට පත්කරන සිද්ධියකි. මේ පිළිබඳ වුඩ්වර්ත් දක්වන අදහස වනුයේ චිත්තවේග යනු පුද්ගලයා වෙනස් වූ හෝ කැළඹුන ස්වභාවයකට පත්කරන්නකි. චිත්තවේග මඟින් ග්‍රන්ථීන් සහ මාංශ පේශීන් වෙනස් භාවයට පත් වේ.

8 අබේපාල, රෝලන්ඩ්, අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම, සාර ප්‍රකාශන, 2015, 69-70 පිටු.

Hurlock ඇයගේ Child Development පොතේ දරුවාගේ චිත්තවේග වල ලක්‍ෂණ වැඩිහිටි චිත්තවේග වලින් වෙනස් වන ආකාරය අංශ කිහියක් ඔස්සේ පෙන්වා දී ඇත.

- **ළමයින්ගේ චිත්තවේග ලුහුඩුය.**
  ළමයාගේ චිත්තවේග විනාඩි කිහිපයක් දක්නට ලැබේ. ක්‍ෂණයකින් අවසන් වේ. චිත්තවේග ප්‍රකාශ කිරීමෙන් දරුවා තමාගේ හැඟීම් පැහැදිලිව දක්වන අතර, එය කෙටි කාලයක් පවතියි.
- **ළමයින්ගේ චිත්තවේග වේගවත්ය.**
  කුඩා ළමයින් ගේ චිත්තවේග වේගවත් වන අතර, මෙය වැඩිහිටි චිත්තවේගවල ඉතා කලාතුරකින් පමණක් දැකගත හැකි ය. කුඩා ළමයින්ගේ චිත්තවේග වල විවිධත්වයක් දක්නට ලැබේ.
- **ළමා චිත්තවේග වෙනස්වන සුළුය.**
  චිත්තවේග අස්ථිර යනුවෙන් අදහස් කරන්නේ චිත්තවේග හැඩීමෙන් සිනහවට වෙනස්වන සුළු බවය. ඊර්ෂ්‍යාව සහ ආදරය මෙන් ම චිත්තවේගවල ප්‍රතික්‍රියා ද වෙනස් වේ.
- **ළමා චිත්තවේග නිතර ඇතිවීම.**
  වැඩිහිටියෙකුට වඩා ළමයින් තුළ චිත්තවේග නිතර ඇති වේ. කුඩා ළමයෙකු වැඩීමත් සමඟ චිත්තවේග බලපෑම් ඇති විවිධ අවස්ථා වලට හැඩ ගැසීමේ හැකියාව ඇත.
- **ළමයෙකුගේ චිත්තවේග ප්‍රතිචාර වෙනස් ය.**
  ළමයින් ගේ චිත්තවේග ප්‍රතිචාරයන්හි විවිධත්වයක් දක්නට ඇත. නිදසුන් ලෙස එක් දරුවෙකු බිය නිසා කාමරයෙන් ඉවතට යන අතර, තවත් ළමයෙකු මවගේ සාරිපොට පිටුපස සැඟවිය හැක.
- **ළමයින් තම චිත්තවේග කෙලින් ම ප්‍රකාශ කිරීම**
  වැඩිහිටියන්ට තම චිත්තවේග සඟවා සිටීමේ හැකියාව ඇති නිසා ඒවා කෙලින්ම ප්‍රකාශ නොවේ. නමුත් ළමයා තම චිත්තවේග නොසඟවා පිටකිරීමට යොමු වේ.[9]

**ළමා සමාජ සංවර්ධනය**

ජීව විද්‍යාත්මක වස්තුවක් වශයෙන් දරුවා වර්ධනය වෙත්ම ශාරීරික, මානසික, චිත්තවේගීය සහ ආකල්පමය හැසිරීමෙන් පමණක් නොව සමාජ හැසිරීමෙන් ද සංවර්ධනය වේ. තමා ජීවත්වන සමූහය සමඟ අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධතාවයකින් යුක්තව ජීවත්වීම ළමයාගේ සංවර්ධනය සඳහා ප්‍රබලව බලපානු ලබයි. තමා අයත් සමාජයේ සිරිත් විරිත්, ආචාර ධර්ම, භාෂාව, සදාචාරය, ජීවත්වීමේ සහ චින්තනයේ විශේෂ ලක්‍ෂණ මෙම සමාජ සංවර්ධනය සමඟ සිදු වේ.

ළමා සමාජ සංවර්ධනය සඳහා බලපානු ලබන සාධක ලෙස නිවසේ පරිසරය, පවුලේ සමාජ ආර්ථික තත්ත්වය, ආදරය හා දයාව, සමාජ සංවිධානවල සහභාගීත්වය, පාසලේ වැඩසටහන්, ක්‍රීඩා කණ්ඩායම්, සමවයස් සම්බන්ධතා, ආගම ආදි සාධක මූලික වන අතර මීට අමතරව රජය, පෞද්ගලික දේපල, භාෂාව, ආරය හා වෙනත් ශාරීරික සාධක ද පදනම් වේ.

[9] බණ්ඩාරනායක, අභය, අබේපාල, රෝලන්ඩ්, චිත්තවේග කළමනාකරණය, සාර ප්‍රකාශන, 2014, 90-93 පිටු.

**ළමා සදාචාර සංවර්ධනය**

ළමා සංවර්ධන ක්‍රියාවලියේ දී සදාචාර සංවර්ධනය ද ඉතා වැදගත් අවස්ථාවක් ලෙස සැළකිය හැක. සදාචාර සංවර්ධනය යනුවෙන් අවංක බව, කරුණාව, දයාව, සේවය, කීකරු කම ආදී වූ සදාචාර ඇගයුම් අදහස් කෙරේ. සදාචාරයේ ඌනත්වයෙන් සොරකම, බොරුව, වංචාව වැනි භයානක සමාජ මනෝවිද්‍යාත්මක ගැටලු නිර්මාණය විය හැකි ය. මෙයට අමතරව ළමා සදාචාරය තුළ ක්‍රීඩා සම්බන්ධ වූ නීති රීති මෙන් ම දරුවන් හා ඔවුන්ගේ සමවයස් කණ්ඩායම්, දරුවන් හා වැඩිහිටියන්, ස්ත්‍රීන් හා පුරුෂයන් අතර ඇතිවන සම්බන්ධතා පිළිබඳ නීති රීති ද අදහස් කරනු ලබයි.

සදාචාර සංවර්ධනය වෙනත් සංවර්ධනයන් හා සහසම්බන්ධව ක්‍රියා කරයි. සෑම දරුවෙකුම ක්‍රියාකාරී ජීවියෙකි. සංවර්ධනයේ විවිධ අවස්ථා පසුකරන දරුවා වැරදි සහ නිවැරදි දේ දැනගෙන තවත් දරුවෙකුට අයත් දේ අත්පත් කරගැනීම වැරැද්දක් බව තේරුම් ගනී. මුල් අවස්ථාවේ අන් දරුවෙකුට අයත් දේ අත්පත් කරගැනීමෙන් සතුටක් ලබන දරුවා සදාචාර පරිණත බව ලැබීමෙන් පසු ඔහුගේ සීමාවන් ඔහු හඳුනා ගනී.

ළමා සදාචාර වර්ධනය පිළිබඳ මනෝවිද්‍යාඥයින් මෙන් ම සමාජ විද්‍යාඥයින් විසින් ද විවිධ අවධි පිළිබඳ අදහස් දක්වා ඇත. ළමා මනෝවිද්‍යාව පිළිබඳ බොහෝ පර්යේෂණ සිදුකළ ජීන් පියාජේ සදාචාර සංවර්ධනය ප්‍රධාන අවධි දෙකක් යටතේ සිදුවන බව පවසයි.

**01. සදාචාර සත්වාදී අවධිය** (උපතේ සිට අවුරුදු 08 දක්වා කාලය)

මෙම කාලය තුළ වැඩිහිටියන් විසින් පනවන ලද නීති පූජනීය ලෙස සළකනු ලබයි.

**02. සදාචාර සාපේක්ෂතා අවධිය** (අවුරුදු 12 හා ඊට වැඩි)

වැඩිහිටි ආඥාවට වඩා එහි සදාචාරාත්මක වටිනාකම පිළිබඳ ළමයා මෙම කාලයේ දී ඉගෙන ගනී.[10]

මෙයට අමතරව පෙක් හා හැවින්හර්ට්ස් සදාචාර සංවර්ධන අවධි 05 කට බෙදා දක්වා ඇත.

01. **විශීල අවධිය** - ළදරු අවධිය

02. **අවස්ථාවාදී අවධිය** - මුල් ළමාවිය

03. **සංරූපතා අවධිය** - මැද ළමාවිය

04. **අතාර්කනික හෘදය සාක්ෂියෙන් යුතු අවධිය** - පසු ළමාවිය

05. **තාර්කනික පරාර්ථකාමී අවධිය** - නව යොවුන් විය හා පරිණත විය

---

[10] අබේපාල, රෝලන්ඩ්, ජීන් පියාජේගේ ප්‍රජානන වර්ධනය, සාර ප්‍රකාශන, 2016, 73-75 පිටු.

**ළමා භාෂා සංවර්ධනය**

ළමයින්ගේ භාෂා වර්ධනය ප්‍රජානන වර්ධනයත් සමග අත්වැල් බැදගෙන ඇත. අතීතයේ භාෂා වර්ධනය සළකන ලද්දේ සහජයෙන්ම ලැබෙන ස්වාභාවික දායාදයක් ලෙසිනි. මේ අදහසයට මුලින් ම අභියෝග කරන ලද්දේ ඇරිස්ටෝටල් විසිනි. ඔහු ළමයා විසින් භාෂාව අත්පත් කරගත යුත්තක් බව දක්වයි. ළමයින්ගේ භාෂා වර්ධනය සඳහා පරිසරාත්මක සාධක මෙන් ම සංස්කෘතික සාධක අත්‍යවශ්‍ය බව පෙනේ. සූසන් අයිසෙන්ක් පවසන පරිදි ළමයින් භාෂාව වර්ධනය කරගන්නේ වැඩිහිටියන් අනුකරණයෙන් පමණක් නොවේ. භාෂාව පිළිබඳ අවබෝධය ළමයා තුළ ඇති වන අතර, නව ආකාරයට භාෂාව යොදාගනිමින් අදහස් ප්‍රකාශ කිරීමට ළමයා තුළ සීමාසහිත හැකියාවක් ඇත.

ළමයින් පළමු වසර දක්වා පැහැදිලි ලෙස වචන කතා කිරීම නොකරයි. ඔවුන් කතා කිරීම ආරම්භ කරන්නේ මාස 18 දීය. මාස 18ක් දක්වා පූර්ව කථන අවධිය ලෙස හැඳින්වේ.

අම්මා තාත්තා සහෝදර සහෝදරියන් සහ පවුලේ අනෙකුත් අය දරුවා කැමති ආසා කරන ක්‍රීඩා භාණ්ඩ, සුරතල් සතුන්, බෝනික්කන්, පින්තූර සහ දරුවාගේ පරිසරයේ ඇති දේවල් පෙන්වමින් කතා කිරීම තුළින් දරුවා කතා බහට හුරු කිරීමටත් දරුවාගේ භාෂා හැකියාවන් වර්ධනය කිරීමටත් හැකියාව ඇත.

**ළමා සංවර්ධනය සඳහා බලපාන සාධක**

ළමා සංවර්ධනය සඳහා බලපානු ලබන සාධක රාශියක් පිළිබඳ මනෝවිද්‍යාව විෂය ක්ෂේත්‍රය තුළ සාකච්ඡා වී ඇත. ඒ පිළිබඳ මනෝවිද්‍යාඥයන් අතර විවිධ මතවාද අදහස් පවතින නමුත් ළමා සංවර්ධනය සඳහා බලපානු ලබන පොදු සාධක කිහිපයක් හඳුනාගත හැක.

**ආරය හා පරිසරය**

මානව සංවර්ධනය කෙරේ ආරය හා පරිසරය යන දෙකම බලපාන බව මනෝවිද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ පිළිගෙන ඇත. නමුත් මේ පිළිබඳ මතභේද නැත්තේ ද නොවේ. මෙහි ආරය යනු පුද්ගලයෙකු සතු ලක්ෂණ පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය වීමයි. මෙය පුද්ගලයෙකුගේ යහපත් මෙන් ම අයහපත් ලක්ෂණ ස්ථාපිත කිරීමට මෙන් ම පුද්ගල අනාගත විභව්‍යතා තීරණය කිරීමට තීරණාත්මක සාධකයක් වේ. ආරමය බලපෑම උරුම වන්නේ මව හා පියා යන දෙදෙනාගෙන්ම ය. එසේම එය නැවත වෙනස් කළ නොහැකි වූ තත්ත්වයකි. සෝවියට් දේශය ආරමය සාධකය ප්‍රතික්ෂේප කළේ ය. ඔවුන් පැවසුවේ පරිසරය රිසි පරිදි සකස්කර ගැනීමෙන් පුද්ගලයා ද අවශ්‍ය ආකාරයෙන් සංවර්ධනය කරගත හැකි බවයි. වෙනත් විෂයයන්හි මෙන් නොව මනෝවිද්‍යාවේ දී පරිසරය සාධකය බෙහෙවින් පුළුල් වූ දෘෂ්ටි කෝණයකි. එනම් පුද්ගලයාගේ වටා පිටාවේ පවතින ස්වාභාවික පරිසරය මෙන් ම ආහාර, වාසස්ථාන, අධ්‍යාපනය, සමාජය ආදී සෙසු සියලුම දේවල් එයට ඇතුළත් වේ. කලල බීජයක පළමු පරිසරය මව්කුස තුළම නිර්මිත වේ. එහිලා ගර්භාෂයේ සෛල, ශ්‍රාව, හෝර්මෝන, රසායන ආදී සියල්ල පරිසර සාධක ලෙස දක්වා ඇත.

උපතින් අනතුරුව ජීවියා මුහුණ දෙන පරිසරය බෙහෙවින් සංකීර්ණ හා ප්‍රතිවිරෝධාත්මක වූවකි. නිවස අවට පරිසරය, සිරිත් විරිත්, සංස්කෘතිය, ආගම, දේශපාලනය, ලෝකය, විශ්වය දක්වා එය

පැතිරේ. එහෙත් ඇතමෙක් පරිසරයට දෙවෙනි තැන දෙන අතර ආරය ප්‍රමුඛ කොට සළකයි. කෙසේ වෙතත් ළමා සංවර්ධනයෙහිලා ආරය හා පරිසරය යන කරුණු දෙකම නියත සාධක වශයෙන් සැළකේ. එහෙත් ආරයෙන් ලැබෙන කොටසත් පරිසරයෙන් ලැබෙන කොටසත් කොතරම්දැයි ප්‍රමාණාත්මක වශයෙන් හරිහැටි තක්සේරු කළ නොහැක. නමුත් පුද්ගලයාගේ ශාරීරික සාධක වැඩි වශයෙන් ආරයෙන් ද, ඉගෙනීම බුද්ධිය වැනි පෞරුෂ සාධක පරිසරයෙන් ද ලැබෙන බව සාමාන්‍ය පිළිගැනීමයි.

**පරිණතිය හා ඉගෙනුම**

පරිණතිය මෙන් ම ඉගෙනුම ද ළමා සංවර්ධනයේ දී නියත සාධක වශයෙන් අවිවාදයෙන්ම පිළිගත හැක. "පරිණතිය" යනු මේරීම හෙවත් ළමයාගේ වයස අනුව සිදුවන මේරීමය. මෙය සමාජයේ හෝ පරිසරයේ බලපෑමකින් තොරව ළමයා තුළින්ම ඉබේටම සිදුවන ක්‍රියාදාමයක ප්‍රතිඵලයකි. ආරය, සෞඛ්‍ය, පෝෂණය වැනි ශාරීරික හේතු යම් තරමකට මේ කෙරේ ඉවහල් විය හැකිය.

"ඉගෙනීම" යනු පරිසරය ඇසුරින් ළමයා ලබන අත්දැකීම් වලින් අවශෝෂණය කර ගන්නා දේවල් ය. මේ අනුව ඉගෙනුම බොහෝ දුරට පරිසරය හා බැඳේ. තමා ජීවත් වන අවට පරිසරයේ ඇති දේවල් ළමයා ඉගෙනුම ලබයි. එහෙත් ඉගෙනීම සඳහා පරිණතිය ද අවශ්‍ය වේ. පරිණතියෙන් තොරව ඉගෙනුම ලද නොහැකිය. එබැවින් ළමා සංවර්ධනය සම්බන්ධයෙන් පරිණතිය හා ඉගෙනුම එකම කාසියක දෙපැත්ත බඳු අන්‍යෝන්‍යාකාරක ව බලපාන සාධකද්වයකි.

**ලිංගිකත්වය**

ලිංගිකත්වය හෙවත් ස්ත්‍රී පුරුෂ භාවය ද ළමා සංවර්ධනයට බලපාන පොදු සාධකයකි. විශේෂයෙන් ම ළමයාගේ ශාරීරික සංවර්ධනයේ ස්වාභාවික ගැහැණු පිරිමි බව අනුව වෙනස් වේ. උපතේ දී පිරිමි ළමයින් ගැහැණු ළමයින්ට වඩා බරින් හා විශාලත්වයෙන් ද වැඩිය. එහෙත් වැඩීමේ දී ගැහැණු ළමයා පිරිමි ළමයාට වඩා වැඩි වේගයෙන් ඉක්මනින් වැඩේ. විශේෂයෙන් ම නව යෞවනෝදයට එළඹීමේ දී ගැහැණු ළමයා අවුරුදු 11-12 පමණ වන විට වැඩිවියට පත් වී, අවුරුදු 12-13 පමණ වන විට කායික වර්ධනයේ පූර්ණත්වයට පත් වේ. පිරිමි ළමයින් තරමක් සෙමින් වැඩී අවුරුදු 14-16 දී පමණ පූර්ණත්වයට පත් වේ. ස්ත්‍රී පුරුෂ වෙනස ළමා සංවර්ධනයට බලපාන ආකාරය ඉතා මැනවින් පෙනී යන්නේ අවුරුදු 10-14 අතර නව යෞවන අවධියේ දීය.

**නිර්නාල ග්‍රන්ථිවල ක්‍රියාකාරීත්වය**

පූර්ව ප්‍රසව අවධියේ නිර්නාල ග්‍රන්ථිවල ක්‍රියාකාරීත්වය ළමා සංවර්ධනය කෙරේ ඉවහල් වේ. විශේෂයෙන්ම මොළයේ පිහිටි පිටියුටරි හා පිනියල් යන ග්‍රන්ථීන් මඟින් දරුවාගේ වැඩීමට අවශ්‍ය හෝර්මෝන ලබා දේ. ළමයාගේ උස මහත තරබාරුකම ආදිය පාලනය කිරීම මෙම ග්‍රන්ථීන් මඟින් සිදු වේ. ගැහැණු ළමයින් වැඩිවියට පත්වීමටත්, පිරිමි ළමයින් ද්විතීයික ලිංගික ලක්ෂණ පහළ කිරීමටත් පිටියුටරි ග්‍රන්ථිය බලපානු ලබයි. මීට අමතරව උගුරේ දෙපස පිහිටා ඇති තයිරොයිඩ් ග්‍රන්ථිය හා පැරාතයිරොයිඩ් ග්‍රන්ථිය ඉතා වැදගත් වූවකි. ශරීරයේ ක්‍රියාකාරී බව, විඩාවට ඔරොත්තු දීම, ශරීරයේ බර පාලනය කිරීම තයිරොයිඩ් ග්‍රන්ථියෙන් සිදුවන අතර ළමයාගේ කැල්සියම් හා පොස්පරස් රුධිරයට එක්වීම පාලනය කරමින් චිත්ත වේගිකතා පාලනය කිරීම පැරාතයිරොයිඩ්

ග්‍රන්ථිය මඟින් සිදු වේ. ඉන්සියුලීන් මඟින් සීනි නිපදවීමෙන් ශරීරයේ ක්‍රියාකාරීත්වය අවශ්‍ය ශක්තිය ලබා දේ. එය ආමාශය ආශ්‍රිතව පිහිටා ඇති අග්න්‍යාශය ග්‍රන්ථිය මඟින් සිදු වේ. විශේෂයෙන් මොළයේ ක්‍රියාකාරීත්වයට මෙම ග්‍රන්ථිය ඉතා වැදගත් වේ. මීට අමතරව ද්වීතීය ලිංගික ලක්‍ෂණ වර්ධනයවීම, පයෝධර වර්ධනයවීම, ඔසප් චක්‍රය පාලනයවීම, ප්‍රජනන වර්ධනය ගැහැණු ළමුන්ගේ ඩිම්බ කෝෂය ආශ්‍රිතව ඇති ඩිම්බකෝෂ ග්‍රන්ථිය මඟින් සිදු වේ. පිරිමි ළමුන්ගේ ප්‍රජානන ඉන්ද්‍රිය ක්‍රියාකාරීත්වය, ද්වීතීය ලිංගික ලක්‍ෂණ පාලනය වීම වෘෂණකෝෂ ග්‍රන්ථීන් මඟින් සිදු වේ.

**පෝෂණය**

පෝෂණය ළමයාගේ ශාරීරික වැඩීම කෙරෙහි තදින් ම බලපාන සාධකයකි. මාස්ලෝ විසින් ඉදිරිපත් කරන ලද මූලික මනුෂ්‍ය අවශ්‍යතා වලින් ද ප්‍රමුඛත්වය දරන පෝෂණය හෙවත් කායජීවී අවශ්‍යතා සපිරෙන තුරු ඉන් ඉහළ අවශ්‍යතා පවා ඉස්මතු නොවේ. එසේම ළදරු හා ළමා කාලයේ ඇති වන මන්දපෝෂණය ශාරීරික වැඩීමට පමණක් නොව බුද්ධිමය ඌනතාව ආදි කරුණු සඳහා ද බලපානු ලබන බව අණාවරණය වී ඇත.

**පවුල**

පවුල් පසුබිම තුළ දක්නට ඇති පවුලේ තරාතිරම, සමාජ පන්තිය, සමාජ පරිසරය, පවුලේ ආකල්ප, අධ්‍යාපන මට්ටම, චිත්තවේගිකත්වයන්, සාමාජිකයන්ගේ සාමාන්‍ය හැසිරීම් රටා, පවුලේ අයගේ රැකියා, පවුලේ ආර්ථිකය, පවුලේ සාමකාමී හා ප්‍රචණ්ඩකාරී බව ආදි තත්ත්වයන් ළමයාගේ සංවර්ධනයට දැඩිව ඉවහල් වේ.

**සමාජ සංස්කෘතිය**

ළමයින් දෙදෙනෙකු කායික ගතිලක්‍ෂණ අතින් කොතෙක් දුරට සමාන වුව ද එකිනෙකට වෙනස් සමාජ සංස්කෘතීන් දෙකක ඇති දැඩි වන්නේ නම් ඒ අනුව ඔවුන්ගේ සංවර්ධන ක්‍රියාවලියේ වෙනස්කම් සිදුවනු ඇත. මේ අනුව ශාරීරික මෙන් ම සමාජගත බලවේග ද ළමා සංවර්ධනය සඳහා බලපෑම් ඇති කරයි. නිදසුන් වශයෙන් කුල භේදය, ආගම් හා ජාතීන් වශයෙන් ඇති වන වෙනස්කම්, එසේම දීර්ඝ කාලීනව ඇතිවන යුද්ධ, කෝලාහලමය වාතාවරණයන් ද ළමා සංවර්ධනයට බලපෑම් ඇති කරවයි.

**සමවයස් කණ්ඩායම්**

සමවයස් කණ්ඩායම් අතර ඇතිවන ඇලීම්, බැඳීම්, අන්‍යෝන්‍ය විශ්වාසය හා සම්බන්ධතා තුළින් නිර්මාණය වන බන්ධන ළමයාගේ චිත්තවේගික හා ආකල්පමය සංවර්ධනය සඳහා ඉවහල් වේ. මෙම සබඳතා දෙමාපිය සබඳතා ද ඉක්මවිය හැකි අතර හොඳ නරක, සදාචාර විනිශ්චය, සමාජ ඇගයුම්, පුද්ගල ස්වසංකල්පය දක්වා ළමා සංවර්ධනය මෙමඟින් සිදු වේ.

**ආත්ම සංකල්පය**

ආත්ම සංකල්පය යනු පුද්ගලයෙකු තමන් ගැන සිතන ආකාරයයි. තම මව ගැන, පියා ගැන, පවුලේ සෙසු සාමාජිකයන් ගැන, මිතුරු මිතුරියන් ගැන, සමාජය ගැන, තමා ගැන මෙන් ම තම අධ්‍යාපන

සිතුම් පැතුම් අභිරුචි ආකල්ප ආදී වශයෙන් තමන් ජීවත්වීමේ අර්ථය ගැන ළමයා යම් ප්‍රතිවේදයක් ගොඩනගා ගැනීම මින් අදහස් කෙරේ. මෙසේ ඇතිකරගනු ලබන ස්වසංකල්පය ළමා සංවර්ධනය කෙරේ ඉවහල් වේ. වැඩිහිටියෙකු මෙන් ළමයාගේ චින්තන සංකල්පනය වැඩි දියුණු වී නැති නිසා වැඩිහිටියාට මෙන් ම තම ස්වසංකල්පය මෙය යැයි ළමයාට තේරුමක් ඇතිවිය නොහැක. එහෙත් ළමයා තුළ ද තමන් හිතන පතන, කටයුතු කරන, කැමති අකමැති, රුචි අරුචිකම් ආදී වශයෙන් ළමයාගේ කල්පනයන් හෙවත් ස්වසංකල්පයන් පවතින බවත් එය ක්‍රමයෙන් වර්ධනය වන බවත් මනෝවිද්‍යාඥයන් පෙන්වා දී ඇත.[11]

**ළමා සංවර්ධනය පිළිබඳ විවිධ මනෝවිද්‍යාත්මක න්‍යායයන්**

ළමා සංවර්ධනය විග්‍රහ කරන බොහෝ මනෝ විද්‍යාඥයන් එහිලා විවිධ අවධි වර්ගීකරණය කර ඇත. ඒ සියලු වර්ගීකරණයන් පොදුවේ සළකා සැකසූ අවධි වර්ගීකරණයක් පිළිබඳ 02.2.2 යටතේ දක්වා ඇති අතර, ඒ පිළිබඳ බොහෝ මනෝවිද්‍යාඥයින් එකඟතාවයක් පළකොට ඇත. නමුත් මෙහි බෙදෙන වයස් සීමාවන් හා අනුඅවධි පිළිබඳ ඔවුන් අතර මතභේද හා වෙනස්කම් පවතියි. මීට අමතරව මනෝවිද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ බොහෝ න්‍යායයන් ඇසුරෙන් ද ළමා මනෝ සංවර්ධන අවධි පිළිබඳ වර්ගීකරණයන් ඉදිරිපත් කොට ඇති ආකාරය දැකගත හැක.

**මනෝවිශ්ලේෂණවාදී න්‍යාය**

මෙම න්‍යාය සිග්මන් ෆ්‍රොයිඩ් විසින් ඉදිරිපත් කරනලද න්‍යායකි. සිග්මන් ෆ්‍රොයිඩ්ට අනුව ජීවියා සුඛවේදනා මූලධර්ම පදනම් වේ. ඒ අනුව ළමා සංවර්ධනය ෆ්‍රොයිඩ් විසින් ඉදිරිපත් කරනු ලබන්නේ සුඛවේදනා මූලධර්ම පදනම් කරගෙනය. උපතේ සිට දරුවා සුඛාස්වාදය ලබමින් පසුකරගෙන යනු ලබන ශාරීරික සංවර්ධන අවධි 05ක් ෆ්‍රොයිඩ් දක්වා ඇත.

**01. මුඛීය අවධිය** (උපතේ සිට අවුරුදු 02 දක්වා)

මෙකල දරුවාගේ සුඛය ලබාගැනීමේ මූලික මාධ්‍ය මුඛය වේ. මුඛය කේන්ද්‍ර කොටගෙන තෘප්තිය ලබන අතර, අතට අසුවන සෑම දෙයක්ම කටට ගෙනයයි. මුඛය මනුෂ්‍ය ශරීරයේ සියුම් ශෘංගාරය දනවන ඉන්ද්‍රියයක් වශයෙන් ද සැළකේ.

**02. ගුද අවධිය** (අවුරුදු 02 සිට 04 දක්වා)

ආහාර ගැනීම හැරුණු විට ළමයාට වැදගත් වන්නේ මළපහ කිරීමයි. මළපහ කිරීම දරුවාගේ ප්‍රධාන වින්දන මාධ්‍ය කොට සළකන අතර, මෙකල ගුද මාර්ගයෙන් තෘප්තිය ලබයි. මේ නිසා ඊට බාධා නොකර කලට වේලාවට පහසුවෙන් මළපහ කිරීමට සැලැස්වීම වැදගත් ය.

**03. ලිංග රූපික අවධිය** (අවුරුදු 04 සිට 07 දක්වා)

ප්‍රාග් ලිංගික අවධියක් වන මෙකල ළමයා ලිංගික පිහිටීම, ඒවායේ වෙනස්කම් පිළිබඳ කුතුහලය ඔස්සේ අවබෝධය කරා යන අතර ප්‍රජනන ඉන්ද්‍රිය ප්‍රදේශය අතගෑමෙන්, ස්පර්ශ කිරීමෙන්

---

[11] අබේපාල, රෝලන්ඩ්, මුල් ළමාවිය සංවර්ධනය හා අධ්‍යාපනය, සාර ප්‍රකාශන, 2007, 104-108 පිටු.

තෘප්තිය ලබයි. මෙවැනි පුරුදු දරුවාගේ මනෝලිංගික වර්ධනයේ ස්වභාවයක් වන බැවින් ඒවා තහනම් කිරීම, මර්දනය කිරීම, ලැජ්ජාවට පත් කිරීම නොකළ යුතු අතර ඒවා ළමයා තුළින් අතහැර දැමිය යුත්තේ ප්‍රවේශමෙනි.

**04. ගුප්ත අවධිය** (අවුරුදු 07 සිට 11 දක්වා)

ලිංගික නිසලතා කාලයක් වන මෙම කාලය තුළ ලිංගික උනන්දුවක් දැකිය නොහැකි අතර, සුඛාස්වාදය ලැබීමේ නියමිත මාර්ගයක් ද දැකිය නොහැක. තෘප්තිය සැඟවී ඇතැයි සැළකෙන මෙකල නොපැහැදිලි, අඳුරු, ගුප්ත අවධියක් වශයෙන් සැළකේ.

**05. වෘද්ධ කාමික අවධිය** (අවුරුදු 11 න් ඔබ්බට)

ජීවියා නව යොවුන් වියට පත්වීමත් සමගම විරුද්ධ ලිංගිකයන් කෙරේ ඇදී යාමේ ආකර්ෂණය ඇතැම්විට සමලිංගික ඇසුර ආදිය මෙකල තෘප්ති මාර්ග අතර ප්‍රධාන වනු ඇත.

**ප්‍රජානන වර්ධන න්‍යාය**

සුප්‍රකට මනෝවිද්‍යාඥ ජීන් පියාජේ විසින් ඉදිරිපත්කරන ලද මෙම න්‍යායට අනුව ළමා සංවර්ධනය දකින්නේ බුද්ධි වර්ධන ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් වශයෙනි. උපත ලබන අවස්ථාව වන විට ළමයාට කිසිදු චින්තන ශක්තියක් නොමැති අතර කෙමෙන් පරිසරයෙන් ලබන අත්දැකීම් ඔස්සේ චින්තනමය හැකියාව ආරම්භ කොට වැඩි දියුණු කරගැනීම තුළින් සිදුවන බුද්ධි වර්ධනයේ ප්‍රතිඵලයක් වශයෙන් ළමා සංවර්ධනය සිදුවන බව මෙම න්‍යායේ හරයයි. මෙසේ ළමයා විසින් අත්පත් කරගනු ලබන බුද්ධි වර්ධනය හෙවත් ප්‍රජානන වර්ධන ක්‍රියාවලිය අවධි 04 ක් යටතේ පියාජේ විසින් වර්ගීකරණය කරනු ලැබ ඇත. සිග්මන් ෆ්‍රොයිඩ්ගේ වර්ගීකරණය මනුෂ්‍ය ශරීර කොට්ඨාස අනුව සිදු වූ අතර ජීන් පියාජේගේ වර්ගීකරණය බුද්ධිමය ප්‍රජානන වර්ධනයේ ස්වභාවය අනුව වීම මෙහි ඇති විශේෂ ලක්ෂණයයි. එම වර්ගීකරණය නම්,

**01. ඉන්ද්‍රිය චාලක අවධිය** (උපතේ සිට අවුරුදු 02 පමණ දක්වා)

මෙකල ඉන්ද්‍රිමය හෙවත් චාලකමය ක්‍රියාකාරීත්වය ප්‍රධාන වන අතර එමඟින් ලබාගන්නා අත්දැකීම් මත බුද්ධි වර්ධනය කරගනු ලබයි. මෙහි දී සිතීමේ හෝ පරිකල්පනය කිරීමේ ශක්තියක් නොපෙනේ.

**02. පූර්ව සංකල්පන හා ප්‍රතිභා චින්තන අවධිය** (අවුරුදු 02 සිට අවුරුදු 07 දක්වා)

මෙකල සංකේත අභ්‍යන්තරීකරණය කරගැනීම හා භාෂා වර්ධනය වේගවත් වීම විශේෂ ලක්ෂණය වශයෙන් පෙන්වා දිය හැක. භාෂාව වැඩි දියුණු වීම ද්‍රව්‍ය හා සංකේත වෙන් කර ගැනීමටත් චින්තනයේ වේගය හා ස්වරූපය වැඩිවීමටත් බලපායි. ආත්ම කේන්ද්‍රීය බවින් යුතු අවධියක් වන මෙකල අන් අයද තමන් සිතන කරන දේ අනුමත කළ යුතු යැයි සිතයි.

**03. සංයුක්ත චින්තන අවධිය** (අවුරුදු 07 සිට අවුරුදු 11 දක්වා)

මෙකල සංයුක්ත සිදුවීම් හා ද්‍රව්‍ය පදනම් කොටගෙන බුද්ධි වර්ධනය කරගනු ලබන අතර, යම් යම් දේ කාණ්ඩ කිරීම, වර්ග කිරීම, වටිනාකම් අනුව පිළියෙල කිරීම, ද්‍රව්‍යවල ප්‍රමාණය පරිමාව තේරුම් ගැනීම ආදී හැකියාවන් ලබයි. ආත්ම කේන්ද්‍රීය බවින් ටික ටික මිදෙන අතර ආපස්සට සිතීමේ හැකියාව ලබයි.

**04. විධිමත් චින්තන අවධිය** (අවුරුදු 11 සිට ඔබ්බට)

ප්‍රජානන වර්ධනයේ ඉහළම අවධිය ලෙස සැළකෙන මෙකල වන විට ළමයා විධිමත් ලෙස චින්තනයේ යෙදෙමින් යමක් අවබෝධ කරගැනීමට, තර්කානුකූලව සිතීමට, හේතුවල සම්බන්ධතා අනුව අත්හදා බැලීම් වලට හැකියාව ලබයි. ආත්ම කේන්ද්‍රීය බව වෙනුවට සමාජ කේන්ද්‍රීය බවට මාරුවෙන මෙකල අයුක්තියට අසාධාරණයට එරෙහි වන අතර සාධාරණත්වය සදාචාරාත්මක බව අගයයි. තර්කයට නොපැකිලිව ඉදිරිපත් වන මෙකල විවෘත චින්තනයේ යෙදෙමින් මානසිකව ගැටලු විසඳයි. පියාජේට අනුව මෙකල ළමා බුද්ධි වර්ධනයේ ඉහළම මට්ටමට පත් වේ.

**චර්යාවාදී න්‍යාය**

බී. එෆ්. ස්කිනර් ප්‍රමුඛ චර්යාවාදී විද්‍යාඥයන් ළමා සංවර්ධනය අර්ථ නිරූපනය කරන්නේ චර්යාවාදී මූලධර්ම හෙවත් ප්‍රබෝධක ප්‍රතිචාර බන්ධන න්‍යාය මඟිනි. ඔවුනට අනුව ළමයා විවිධ ආකාරයෙන් හැසිරෙන්නේ ප්‍රබෝධකයන්ට ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලියක් වශයෙනි. මේ අනුව ළමා සංවර්ධනය සිදුවන්නේ පෙරදී ප්‍රබෝධකවලට දැක් වූ ප්‍රතිචාර හෙවත් චර්යා හැසිරීම් බන්ධනය වීමෙනි. පසුව එම චර්යා වෙනත් ප්‍රබෝධකවලට ගොදුරු වී නැවත අලුත් චර්යා හටගනී. සංවර්ධනයේ අවධි බෙදීමක් හෝ වර්ගීකරණයක් ගැන සඳහන් නොකරණ චර්යාවාදීන් ළමයින් තුළ වත්මනෙහි දක්නට ලැබෙන චර්යා වටහාගෙන ඒ මත නව චර්යා සම්බන්ධ වීමෙන්, චර්යා සංවර්ධනය වීමත් සමඟම ළමා සංවර්ධනය සිදුවන  බව දක්වයි.

**මානවවාදී න්‍යාය**

මාග්‍රට් මීඩ් වැනි සමාජ මානව විද්‍යාඥවරියන් විසින් ළමා සංවර්ධනය අර්ථකථනය කරනු ලබන්නේ එය සමාජ සංස්කෘතික පරිණතියක් වශයෙනි. මෙම සමාජ සංස්කෘතික න්‍යාය පරිදි ළමයා ජීවත් වන පරිසරය අනුව එකිනෙකාට වෙනස්කම්වලින් යුතු පෞරුෂ සහිතව වැඩේ. සංස්කෘතිය තුළ පවතින විවිධ බලපෑම් ළමයා හැසිරවිය යුතු ආකාරය තීරණය කරන බව පැවසේ. මේ අනුව සමාජය හා සංස්කෘතිය අතර ඇතිවන අන්‍යෝන්‍ය ක්‍රියාකාරකම් ඔස්සේ ළමා සංවර්ධනය සිදුවනු ඇත.

**සමාජ විද්‍යා න්‍යාය**

සමාජ මානව විද්‍යාඥයෙකු වන ඇල්ෆ්‍රඩ් ඇඩ්ලර් විසින් ඉදිරිපත් කරන ලද සමාජ විද්‍යා මතය අනුව ළමා සංවර්ධනය සමාජයීය සංවර්ධනය තුළින් සිදුවන බව ප්‍රකාශ වේ. සමාජ පරිසරය තුළ ජීවත් වන ළමයා විවිධ සමාජමය අවශ්‍යතාවන් මත හැසිරෙන බව පවසන ඇල්ෆ්‍රඩ් ඇඩ්ලර් ළමයා සමාජ ජීවියෙකු ලෙස හඳුන්වයි. මේ අනුව උපතේ සිට වැඩිහිටි විය කරා සංවර්ධනය වීමේ දී විවිධ සමාජතල හරහා ළමයා ගමන් කරන බවත්, එම සමාජ තල අනුව විවිධ චර්යාවන් දක්වන බවත් හෙතෙම සඳහන් කරයි. නිදසුන් ලෙස උපතින් පසු ළදරු හා ළමා කාලවලදී ආත්මකේන්ද්‍රීයව සීමිත

සමාජ තලයක ජීවත් වුව ද නිවස අවට පරිසරය, පාසල, බැහැර සාමාජයීය අත්දැකීම් ලැබීමත් සමඟ ඇතිවන සමාජයීය වර්ධනය හේතුකොටගෙන ක්‍රමයෙන් ආත්මකේන්ද්‍රීය බව අඩු වී යයි.

**ජීවවාදී න්‍යාය**

හසුන්, මැනර් වැනි විද්‍යාඥයන් ළමයාගේ සංවර්ධනය ජීවවිද්‍යාත්මක ව සිදුවන බව පෙන්වා දී ඇත. මේ අනුව සෑම පුද්ගලයෙක් ම ඒකාකාර රටාවක් අනුව සංවර්ධනය වේ. එසේ වුව ද පුද්ගලගත විශේෂතා අනුව වර්ධන වේගය අඩු වැඩි විය හැකි ය. ළමයාගේ වර්ධනයේ පැහැදිලි අනුපිළිවෙළක් හා වර්ධන චක්‍රවලින් යුක්ත වේ. එහෙත් එක් එක් පද්ධතීන්ගේ වර්ධනය වෙන වෙන ම නොව සමස්ත වශයෙන් සළකා බැලිය යුතු ය. ළමා සංවර්ධනය ජීව වයස අනුව සිදුවන බව දක්වන ඔවුහු ජීව වයස සොයාගැනීම සඳහා ළමයාගේ උස, බර, දත්, ඇටසැකිල්ලේ මේරීම, ග්‍රහණ ශක්තිය, මානසික වයස ආදී සාධක ඉවහල් වන බව පෙන්වා දෙති.

**වෙගොට්ස්කිගේ භාෂා කේන්ද්‍රිත න්‍යාය**

ළමා සංවර්ධනය පිළිබඳ ස්වකීය වූ මතයක් ඉදිරිපත් කරන වෙගොට්ස්කි නම් මනෝවිද්‍යාඥයා ළමයෙකුගේ සංවර්ධනය පිළිබඳ සැබෑ සංවර්ධනය හා විභව්‍ය සංවර්ධනය වශයෙන් මට්ටම් දෙකක් යටතේ දක්වයි. කිසියම් නිශ්චිත අවස්ථාවක දරුවාට යම් දෙයක් කිරීමට ඇති හැකියාව සැබෑ සංවර්ධන මට්ටම වන අතර, එය මානසික පරීක්‍ෂණයකින් වුවද තක්සේරු කළ හැක. මෙය වෙනත් අකාරයෙන් පැවසීමේ දී යම් අවස්ථාවකදී ළමයාගේ ස්වාභාවික හැකියාවන් තුළින් සැබෑ සංවර්ධන මට්ටම නිරූපණය වේ.

විභව්‍ය සංවර්ධන මට්ටම යනුවෙන් වෙගොට්ස්කි අදහස් කරනු ලබන්නේ අන් අයගේ උපකාරය හෝ ඉගෙනුම මඟින් ළමයා ළඟා කරගනු ලබන හැකියාවයි. වෙගොට්ස්කිට අනුව මෙම මට්ටම කරා ළමයා ළඟාවන්නේ භාෂාව මාධ්‍ය කොටගෙනය. එසේම මෙම න්‍යාය අනුව ළමයා ඉගෙන ගැනීම හෝ සංවර්ධනය වීම සිදුවන්නේ තමා අවට සිටින අන්‍යයන්ගේ බුද්ධිමය තත්ත්වය සමඟ සමාජානුයෝජනය වීමෙනි.[12]

[12] අබේපාල, රෝලන්ඩ්, මුල් ළමාවිය සංවර්ධනය හා අධ්‍යාපනය, සාර ප්‍රකාශන, 2007, 110-125 පිටු.